## මතුගම ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ජූලි 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල රු.34,000,000 ක් වූ මුද්දර ගාස්තු ආදායම වෙනත් ආදායම් යටතේ නොදක්වා සේවා සඳහා ගාස්තු යටතේ දක්වා තිබුණි.

(ආ) සභාවේ පෙර ගෙවුම් ශේෂය තුළ ඇතුළත් පෙර වර්ෂවල නොපියවූ අත්තිකාරම් වැඩි ප්‍රතිශතයක් අයකරගෙන ඇතත් ඒවා ගිණුම්වලට ගලපා නැති බව නිරීක්ෂණය විය.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ආයෝජන රු.10,620,968 කින් වැඩිවීම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත්, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ii) ආදායම් ණයගැතියන් වැඩිවීම රු.48,754,539 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.53,630,146 ක් වශයෙන් දක්වා තිබුණි.

(iii) අයකරගත හැකි උපයෝගී සේවා වැඩිවීම රු.2,875,606 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.290,316,750 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු12,137,349 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 14,075,479 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු1,938,130 ක පසුබෑමක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000’ | රු.000’ | රු.000’ |
| (i) වරිපනම් හා බදු | 15,073 | 12,439 | 4,725 |
| (ii) බදු කුලී | 5,396 | 4,949 | 636 |
| (iii) බලපත්‍ර ගාස්තු | 267 | 267 | -- |

2.2.2 **වරිපනම් බදු**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.5,473,544 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට ඉන් රු.3,406,340 ක් හෙවත් සියයට 62 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) මතුගම උප කාර්යාලයේ රු.5,000 ට වැඩි ඒකක 42 කින් රු.414,098 ක ශේෂයක් අයකරගෙන නොතිබුණි.

2.2.3 **වෙළඳ ස්ථාන කුලී**

පොදු වෙළඳපොල අංක 55 කඩකාමරය සඳහා හිඟව පවත්නා රු.72,600 ක මුදල අයකරගෙන නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 18,500,000 |
| (ii) | මුද්දර ගාස්තු | 60,994,435 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 2015 හා 2016 වර්ෂවලදී සභාව සතු ඉඩම් 09 ක් මැනීම සඳහා රු.323,259 ක් ගෙවා තිබූ නමුත් සුසානභූමි 05 ක පමණක් ආරක්ෂිත වැට ඉදිකර නාම පුවරු සවි කර තිබුණි.

(ආ) ගම් කාර්ය සභා ආඥා පනතේ 32 වන වගන්තිය යටතේ 1976 සැප්තැම්බර් 27 දින මතුගම ප්‍රාදේශීය සභාව වෙත පවරා දී තිබූ අක්කර 02 යි, පර්චස් 33 ක විශාලත්වයකින් යුක්ත වැල්කන්දල කැටේලන්ද සුසාන භූමිය පෞද්ගලික පාර්ශව හයක් විසින් අනවසරයෙන් වගා කටයුතු සිදු කිරීම නිසා බස්නාහිර පළාත් සභාවේ මහජන පෙත්සම් කාරක සභාවේ 2016 මැයි 24 දින පෙත්සම විභාග කර තිබුණි. එහි විභාග වූ කරුණු

අනුව අවුරුදු 50 ක කාලයක් ස්ථිර ලෙස වගා කරමින් ඉඩම භුක්ති විඳින බව නිරීක්ෂණය කර තිබූ අතර ප්‍රාදේශීය සභාව විසින් සභා දේපල නිසි ආකාරයෙන් ආරක්ෂා කර නොගැනීම හේතුවෙන් මෙලෙස අනවසරයෙන් අවභාවිතා වී තිබුණි.

(ඈ) මතුගම ප්‍රාදේශීය සභාවේ සුසාන භූමි ලේඛනයට අනුව සුසාන භූමි 52 ක් පැවති අතර ඉන් සුසාන භූමි 31 ක් පැවරුම් නියෝග මගින් පවරාගෙන තිබුණද එයින් භූමි 16 ක් සඳහා මේ වන තෙක් පැවරුම් නියෝග ලැබී නොතිබුණි. ඉතිරි සුසානභූමි 21 සඳහා පැවරුම් නියෝග ලබාගැනීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙන්දේසි ඉඩම්වලින් පොදු කටයුතු සඳහා ලැබුණු ඉඩම් කොටස් 2 කට අදාල පිඹුරුපත් සභාව සතුව නොතිබුණි.

(ඉ) පුස්තකාලයේ කියවීම් ශාලාව අළුත්වැඩියා කිරීමේදී ගලවා ඉවත් කරන ලද යකඩ කැලි 65 ක් ගබඩා නිලධාරියා මගින් විධිමත් ලෙස භාරගෙන තිබුණද, නිකුත් කිරීම විධිමත් පරිදි කර නොතිබුණි.

(ඊ) <u>කඩ සඳහා කුලී ගිවිසුම්වලට එළඹීම</u>

මතුගම උප කාර්යාලයට අයත් මාලු වෙළඳසැල් අංක 10, පොදු වෙළඳපොල අංක 07 හා වැලිපැන්න උප කාර්යාලයට අයත් නව වෙළඳපොලේ වෙළඳසැල් 05 ක් හා පොදු වෙළඳපොල වෙළඳසැල් 04 ක් බදු දී තිබූ නමුත් ගිවිසුම් ගත වී නොතිබුණි.

(උ) <u>කඩකාමර කුලියට ලබාදීම</u>

(i) මතුගම උප කාර්යාලයට අයත් නො.43 A කඩකාමරය සභාවෙන් වියදම් දැරීමේ පදනම මත බදුකරු විසින් අළුත්වැඩියා කර තිබූ අතර බදුකරු විසින් කඩකුලියෙන් වියදම හිලව් කිරීමට එකඟ වී තිබුණි.

- නිශ්චිතව වියදම තහවුරු කරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.
- 2015 මාර්තු සිට මේ දක්වා මාස දෙකක කුලියක් පමණක් අයකර තිබුණි.

(ii) මෙම කඩකාමරය පිහිටා ඇති ඉඩමේ අයිතියද සභාව සතුව නොමැති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පැවතුණි. මෙම ඉඩම පවරාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(iii) මෙම බදුකරු විසින්ම බදු ගෙන තිබූ අංක 33 දරන කඩකාමරය, මාර්ගය පුළුල් කිරීමට කැඩීම හේතුවෙන් ඒ වන විට සීල් තබා තිබූ අංක 60 දරන කඩකාමරය 2015 වර්ෂයේ සිට ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා ඔහුට ලබාදී තිබූ නමුත් 2016 සැප්තැම්බර් 30 දින දක්වා ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඍ) <u>මතුගම උප කාර්යාලයේ කඩකාමර කුලියට ලබාදීම</u>

(i) අංක 32 කඩකාමරය අතුරු බදු දී තිබූ නමුත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ii) මාලු වෙළඳසැල් අංක 8 කඩ කාමරය බදු ගිවිසුම යාවත්කාලීන කිරීමට බදුකරු ඉදිරිපත් නොවීම නිසා සභාවට පවරාගෙන ඇතත් නැවත ටෙන්ඩර් කර නොතිබුණි.

## 3.2 <u>හානි හා පාඩු</u>

සභාවට අයත් GI බට 142 ක් අස්ථාන ගත වීම පිළිබඳ 2015 දෙසැම්බර් 28 දින පොලිසියේ පැමිණිල්ලක් කර තිබූ අතර ඒ පිළිබඳ විමර්ශණයක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලෙස 2016 පෙබරවාරි 02 දින සභාවේ ලේකම්වරයා විසින් විමර්ශණ නිලධාරීන් හට භාර දී තිබුණි. විමර්ෂණ නිලධාරීන්ගේ විමර්ෂණ වාර්තාවට අනුව එම ඌනතාවය සභාවේ හිටපු සභාපතිවරයාගෙන් අයකරගත යුතු බවට තීරණය කර ඇතත් එම අලාභය ගණනය කර අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 <u>කාර්යසාධනය</u>

2016 ක්‍රියාකාරී සැළැස්ම අනුව සභා කර්මාන්ත 36 ක් ඉටු කළ යුතු වුවත් ඉටු කර තිබුණේ 10 ක් පමණි. තවද, ක්‍රියාකාරී සැලැස්මේ නොමැති සභා කර්මාන්ත 32 ක් ඉටු කර තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය